දරුවන් උදෙසා
බයිබලයක්

# දානියෙල් සහ අභිරහස් සිහිනය



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Jonathan Hay
Alastair Paterson

සකස්කරන්නා: Mary-Anne S.

පරිවර්ථනය කරන්නා



නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org



©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

නෙබුකද්නෙසර් රජු සිහිනයක් දුටු අතර, එම සිහිනය ඔහුට බොහෝ කරදර ඇති කළේය. දෙවියන් වහන්සේගේ බලයෙන්, දානියෙල් හට රජුගේ සිහිනයේ තේරුම පැවසීමට හැකි වූයේය.



දානියෙල් කළ පළමු දෙය
නම් සිහිනය නිශ්චිතව
විස්තර කිරීමයි.
“රජතුමනි, ඔබ විශාල
ප්‍රතිමාවක විශිෂ්ඨ
රූපයක් දුටුවේය. එහි
ස්වරූපය අපූරුය!”



“ප්‍රතිමාවේ හිස රනින් නිමවා තිබුණි” දානියෙල් තවදුරටත් පැවසීය.



“එහි ළය හා අත් රිදීයෙන් කරන ලද්දේය”.



“එහි බඩත් කලවාත් ලෝකඩයෙන් කරන ලද්දේය”.



“එහි දෙපා යකඩින්ද, පතුල් කොටසක් යකඩින් හා කොටසක් මැටියෙන්
කර තිබුණි”.



ප්‍රතිමාව ගැන රජුට විස්තර කළ පසු දානියෙල් සිහිනයේ ඉතිරි කොටස කීවේය.



“අත් පාවිච්චි නොකරමින් සිලුටු කළ ගලක් දෙස, ඔබ බලා සිටියේය” කියා දානියෙල් රජුට කීවේය.



“ගල යකඩින්ද මැටියෙන්ද නිමකළ රූපයේ පාදවල වැදී ඒවා කැබලිවලට කඩා බිඳ දැමුවේය.”



“ඉන්පසු පිළිමය දූවිලි මෙන් කුඩුවී සුළඟට ගසාගෙන ගියේය.
ඒ ගල, විශාල කන්දක් දක්වා වර්ධනය වී මුළු පොළොවම
එයින් පිරී ගියේය”.



රජු විශ්මයට පත් වූයේය. ඔහු සිහිනයෙන් දුටුවේ එයමය! දානියෙල් එය දන්නේ කෙසේද? දෙවියන් වහන්සේ දානියෙල්ට පවසා තිබූ නිසාය. එවිට දානියෙල් එම සිහිනයේ තේරුම නෙබුකද්නෙශර් රජුට කියන්නට පටන් ගත්තේය.



“ස්වර්ගීය දෙවියන්
වහන්සේ ඔබට
රාජයයද බලයද
මහිමයද දුන්
සේකැ”යි
දානියෙල් රජුට
කීය. “ඔබ ඒ
රත්තරන්
හිසය.”



දානියෙල් රජුට පැවසුවේ
රත්තරන් වලට සමාන
ඔහුගේ බලවත් රාජ්‍යයද
අවසන් වන බවය.
ප්‍රතිමාවේ රිදී
කොටසෙන් අදහස්
කළේ දුර්වල
රාජ්‍යයක් එම
ස්ථානයට
පත්වන බවය.
ලෝකඩ කොටසින්
තවත් රාජ්‍යයක්
අදහස් විය.
යකඩ සහ මැටි
හතරවන
රාජධානිය
සංකේතවත්
කළේය.



දානියෙල්, රජුට අවසන් වරට කීවේ මෙයයි: “ස්වර්ගයේ දෙවියන් වහන්සේ කිසිදා විනාශ නොවන රාජ්‍යයක් පිහිටුවනු ඇත.”



දානියෙල්ට, තමුන් දුටු සිහිනය දැන ගැනීමට සහ තේරුම් ගැනීමට ප්‍රඥාව ලබා දිය හැක්කේ දෙවියන් වහන්සේට පමණක් බව රජු තේරුම් ගත්තේය. නෙබුකද්නෙශර් දානියෙල්ට බොහෝ ධනය ලබා දුන් අතර ඔහුව රාජ්‍යයේ ඉතා වැදගත් පුද්ගලයෙකු බවට පත් කළේය.




පළමු,
දෙවැනි
හා තෙවැනි
රාජධානි පැමිණ
නැවත නිමවී ඇත.
හතරවන
රාජ්‍යයෙන්
පසුව දෙවියන්
වහන්සේගේ
රාජ්‍යය
පැමිණෙනු
ඇත.
මෙසියස්
පොළොවේ
රජකම් කරනු ඇත.
එය ඉක්මනින්
විය හැකිය!

දානියෙල් සහ අභිරහස් සිහිනය

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

දානියෙල් 2

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)